# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 ඔක්තෝබර් මස 20 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017. 10. 24 දින නිකුත් කරන ලදී)

### සුරාබදු (සංශෝධන)

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ රා නිපදවනු ලබන තල් ගස් සහ පොල් ගස් මැදීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ නියම කිරීම ඇතුළත් කිරීම වේ.

# සුරාබදු (සංශෝධන)

එල්. ඩී. — ඕ. 63/2016.

## (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 2017 අංක දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2018 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තිය, එම වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආ) කිතුල් ගස් හැර රා නිපදවන වෙනත් ගසක් මැදීම නොකළ යුතු ය;

(ඇ) කිතුල් ගස් හැර වෙනත් කිසිදු ගසකින් රා නිස්සාරණය කිරීම හෝ බෑම නොකළ යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 010389 -475 (2017/10)